**CoViD-19 තත්ත්වය යටතේ නිවසට ම වී සිටින දරුවන්ගේ අධ්‍යාපනය නගාසිටුවීම සඳහා අත්වැලකි.**

**ඉතා වැදගත්**

**නිවසේ සිට පිළිතුරු ලිවීම සඳහා පමණි**

**2021 ඔක්තෝබර් 12 දින සිට ඔක්තෝබර් 15 දින දක්වා සුදුසු දිනයක නියමිත වේලාවක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

# සිසු සවිය 2021

## 5 වන ශ්‍රේණියේ දූ පුතුන්ට අත්වැලක්

**5**

**පස්වන ශ්‍රේණියේ සිසු දරුවන් සඳහා පැවැත්වෙන පෙරහුරු පරීක්ෂණය**
**සබරගමු පළාත.**

**II පත්‍රය.**

## නිවාඩුවට අරුතක්... පෙරහුරු පරීක්ෂණය

**පැය 01 මිනිත්තු 15 යි.**

නම:......................................................................................................................................

## සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශයේ ප්‍රකාශනයකි...

| | |
|---|---|
| I පත්‍රය ලකුණු | : |
| II පත්‍රය ලකුණු | : |
| මුළු ලකුණු | : |

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස් :**

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේ ද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්න වල එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
- පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.

## විශේෂ අවධානය පිණිස...

පාසල්වල විදුහල්පතිවරු පංති භාර ගුරු මහත්ම/මහත්මීන් වෙත...

- මෙම ප්‍රශ්න පත්‍රය මුද්‍රණයකොට හෝ පිටපත් කර **ඔක්.** මස 12 වන දිනට පෙර ඔබ පාසලේ 5 ශ්‍රේණියේ ඉගෙනුම ලබන සෑම දරුවෙකුටම ප්‍රශ්න පත්‍රය ලබාදීමට කටයුතු කරන්න.
- ගැටලුවක් ඇතොත් කොට්ඨාසයේ ප්‍රාථමික ගුරු උපදේශක, කලාප විෂය අධ්‍යක්ෂ හෝ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන අංශය අමතන්න.
- පිළිතුරු පත්‍රය කලාප කාර්යාලය මගින් ඔබට ලබාගත හැකිය. ලකුණු දුරකතනය මගින් ලබාගෙන සාරාංශ වාර්තාවක් සකස් කරන්න. පිළිතුරු ගැන දෙමාපියන්ට ගැටළුවක් ඇතොත් පංතිභාර ගුරුවරුන්ගේ සහාය ලබාගන්න.
- වෙනත් පළාතක, කලාපයක දරුවෙකුට වුවද මෙය ලබාදීමට කටයුතු කරන්න.
- මේ සඳහා ඔබ දක්වන සහයෝගය අගය කරමි.

**- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය -**

දයාබර දෙමව්පියනි,
ආදරණීය දුවේ පුතේ...

කොවිඩ් වසංගතය හේතුවෙන් නිවාඩු කාලයේ නිවසේ සිටින 5 ශ්‍රේණියේ දරුවන් වෙනුවෙන් මෙම පෙරහුරු ප්‍රශ්න පත්‍රය ලබාදෙනු ලැබේ.

**2021 ඔක්තෝබර් 12 දින සිට ඔක්තෝබර් 15 දින දක්වා සුදුසු දිනයක නියමිත වේලාවක් තෝරාගෙන නිවසේ සිට පිළිතුරු ලිවීම අපේක්ෂා කෙරේ.**

| I පත්‍රය | II පත්‍රය |
|---|---|
| පැය 01 යි. | පැය 01 යි මිනිත්තු 15 යි. |

- නිවසේ සුදුසු ස්ථානයන් තෝරාගෙන පිළිතුරු ලිවීමට අවස්ථාව සලසා දෙන්න.
- කිසිදු අනවශ්‍ය පීඩනයක් ඇති නොවන ආකාරයට දරුවන්ට මෙය ලිවීමට අවස්ථාව ලබාදෙන්න.
- මෙදිනට කිරීමට අපහසුවන දරුවන් සඳහා ද මෙය පසු දිනක කළ හැකි බව ද දන්වමි.
- ඉතාමත් සතුටින් හා විනෝදයෙන් මෙම ප්‍රශ්න පත්‍රය ලිවීමට ශක්තිය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**- සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික අධ්‍යාපන ඒකකය -**

**01. පහත දැක්වෙන ඡේදය කියවන්න.**

කාර්යශූර ගොවියකු වූ වස්තුහාමි ධනවත් පුද්ගලයෙකි. දිනක් නැකැත්රාල කෙනෙක් , වස්තුහාමිට ඉදිරියේ දී අයහපත් කාලයක් උදාවන බව පවසයි. එය අසා කම්පාවට පත් වූ වස්තුහාමි කිසිදු කාර්යයක නිරත නොවී අලසව සිටීම නිසා ඔහුගේ වගා බිම් ආදිය විනාශ වී යයි. ඒ හේතුවෙන් ඔහුගේ ධනය පිරිහෙයි.

✷ **ඡේදය ඇසුරින් පිළිතුරු සපයන්න.**

1. ඡේදයේ සඳහන් පුද්ගලයාගේ නම කුමක් ද? ……………………………………………………………
2. නැකැත්රාල පවසන අන්දමට ඔහුට ඉදිරියේ දී සිදුවිය හැකි දේ කුමක් ද? ………………………

   ……………………………………………………………………………………………………………
3. **<u>කම්මැලිව</u>** යන්නට සමානාර්ථ පදයක් ඡේදයෙන් සොයා ලියන්න. …………………………………
4. ඔහුගේ වගාබිම් ආදිය විනාශ වී ධනය පිරිහුණේ ඇයි ? ………………………………………………
5. තාලුජ අක්ෂරයක් සහිත වචනයක් ඡේදයෙන් තෝරා ලියන්න. ……………………………………
6. ඡේදයේ සඳහන් ප්‍රාණවාචී ඒකවචන අනුක්ත පදයක් ලියන්න. ……………………………………

**02. දී ඇති වචන ගළපා අර්ථවත් වැකියක් ලියන්න.**

ප්‍රීතියෙන් / ද / දුවති / බැස යන / පාගමින් / වතුර / ළමයි

……………………………………………………………………………………………………………

**03. පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.**

1. ඈ සීනිබෝලය මා හා බෙදා ගත්තේ ය. (    )
2. සරුංගලය ඈතට පාවී ගියහ. (    )
3. ගෙවිලිය ඇඹුල සකස් කළා ය. (    )
4. සිංහයෝ කැලෑවේ ජීවත් වෙති. (    )

**04. ගැළපෙන විරාම ලකුණු යොදන්න.**

මොක ද වුණේ බොනී කොහේ ද දුවන්නේ උල්ලු විමසුවේ ය

**05. පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු වචනය හිස්තැනෙහි ලියන්න.**

1. ……………………………………………………… ගෙම්බා වගේ.
2. පහත දැක්වෙන අවස්ථාවට ගැළපෙන ප්‍රස්තාව පිරුළ තිත් ඉර මත ලියන්න.

   අදූරදර්ශී උපදෙස් දීම. -…………………………………………………………………

**06. පහත දැක්වෙන එක් එක් වාක්‍යයෙහි නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ඔහු මෙවර (විශිෂ්ඨ/විශිෂ්ට) ප්‍රතිඵල ලබා ගත්තේ ය.
2. මලානික (අවුරැල්ල / අව්රැල්ල) පොළොවට පතිත විය.
3. අහසේ (වලාකුළක් / වළාකුලක්) පා විය.

07. **පහත ඉඟි වැකියට ගැළපෙන අදහස ලියන්න.**

**එක හුස්මට** - ........................................................................................

08. **පහත ආප්තෝපදේශයට ගැළපෙන අදහස ලියන්න.**

ඇවිළෙන ගින්නට පිදුරු නොදමන්න.

........................................................................................................

09. **ස්ත්‍රී ලිංග නාම පදය ලියන්න.**

1. සිංහයා - ........................................................................
2. යහළුවා - ........................................................................

10. **පහත සඳහන් වාක්‍ය ලිඛිත බසින් ලියන්න.**

1. අම්මා කුරහන් රොටී සෑදුවා.

   ..............................................................................................

11. **පෞද්ගලික ලිපියක ආකෘතියක් පහත දී ඇත. ඒ ඇසුරෙන් හිස්තැන් පුරවන්න.**

| | |
|---|---|
| | **ස්ථානය** |
| | **දිනය** |
| **1.** ............................................ | |
| 2. ......................................................... | |
| කරුණු | |
| | අවසානය |

12. **පහත වැකියේ උපමාව යටින් ඉරක් අඳින්න.**

අපේ ගම වටා විහිදී ඇති කඳු පෙළ ගම ආරක්ෂා කරන පවුරක් වැනිය.

13. **පහත යුගල පදය සම්පූර්ණ කරන්න.**

1. අස්සක්..............................

**සුදුසු විරුද්ධාර්ථ පදය ලියන්න.**

1. අවශ්‍ය ................................

(ලකුණු 28)

14. **එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න.**

**1.** 

**2.** 

.................................... ....................................

**15. පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් ගොඩ නඟන්න.**

**1. is / This / house / my**

..........................................................................................................

**2. pet / Do / have / you / a / ?**

..........................................................................................................

**16. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට සුදුසු වචනය වරහන් තුළින් තෝරා යටින් ඉරක් අඳින්න.**

**1. He ………………….. (have / has) a red shirt.**

**2. These ………………….. (are / is) animals.**

(ලකුණු 6)

**17.** 1. **පහත සඳහන් දෙමළ වාක්‍ය සඳහා යෙදෙන සිංහල වාක්‍ය ලියන්න.**

**එනක්කු පුත්තහම් තාරුංගළ් -** ..........................................................................

2. **පහත සඳහන් වාක්‍ය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.**

**එන්න බත් කන්න. -** ..........................................................................

18. '' **අපේ පාසලේ පොදු දේපල සුරකිමු**'' යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍ය තුනක් ලියන්න. (සෑම වාක්‍යයක්ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුය.)

1. ..........................................................................................................

..........................................................................................................

2. ..........................................................................................................

..........................................................................................................

3. ..........................................................................................................

..........................................................................................................

(ලකුණු 06)

**19.** 1. **40100 කොටුවේ ඇති සංඛ්‍යාවට එකක් අඩු සංඛ්‍යාවේ සංඛ්‍යා නාමය ලියන්න.**

..........................................................................................................


2. ⑧**4135** රවුම් කළ සංඛ්‍යාවේ ඉලක්කමෙන් නිරූපිත අගය ලියන්න.

..........................................................................................................

**20. පහත සඳහන් සංඛ්‍යා ආරෝහණ පිළිවෙළට ලියන්න.**


1. 6785 , 6875 , 6578 , 6587 - ..........................................................................

21. 1. පහත රූපයේ 0.4 ක් අඳුරු කර දක්වන්න.



2. පාට නොකළ කොටස භාග සංඛ්‍යාවක් ලෙස දක්වන්න. ........................................


3. පේර ගෙඩි 36 කින් $\frac{3}{4}$ ක ඇති පේර ගෙඩි ගණන කීය ද? ........................................

22. 

1. මෙම ඝනවස්තුවේ නම කුමක් ද?..........................................
2. මෙහි ඇති දාර ගණන කීය ද? ..............................................
3. මෙහි ඇති ශීර්ෂ සහ මුහුණත්වල එකතුව කීය ද? ................

23. එක්තරා පාසලක ගැහැනු ළමයි 1438 ක් ද පිරිමි ළමයි 1605 ක් ද සිටිති.

1. පාසලේ සිටින මුළු ළමයි සංඛ්‍යාව කීය ද? ..........................................................
2. එම පාසලේ ගැහැනු ළමයින්ට වඩා පිරිමි ළමයි කොපමණ සිටිත් ද? .....................

24. 

1. ටැංකියේ සිටින මාළු සංඛ්‍යාව රෝම සංඛ්‍යාංකයෙන් ලියන්න.

.........................................................................................

| iv |
|---|

2. කොටුව තුළ ඇති රෝම සංඛ්‍යාංකය හින්දු අරාබි ඉලක්කමෙන් ලියන්න.

.........................................................................................

25. පහත කොටුවේ ඇති සංඛ්‍යාවලින් 9 ගුණාකාර පමණක් තෝරා ලියන්න.

| 63 | 75 | 45 | 39 | 36 | 54 | 47 |
|---|---|---|---|---|---|---|

.........................................................................................

26. පොත් 707 ක් එක් පාර්සලයකට පොත් 6 බැගින් දමන ලදී.

1. සාදන ලද පොත් පාර්සල් ගණන කීය ද? ..........................................................
2. ඉතිරි පොත් ගණන කීය ද? ..........................................................................


27. 1. පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍ය | මිල දී ගත් ප්‍රමාණය | 1kg ක මිල | | වටිනාකම | |
|---|---|---|---|---|---|
| | | රු. | සත | රු. | සත |
| මිරිස් | 750 g | 600 . | 00 | ......................... | |
| පරිප්පු | 500 g | 156 . | 00 | ......................... | |
| මුළු මුදල | | | | ......................... | |

**2.** බිල්පත සඳහා රු.1000.00ක මුදලක් මුදලාලිට දුන්නේ නම් ලැබෙන ඉතුරු මුදල කීයද?

.........................................................................................

28. පැයක් තුළ දී මාර්ගයක ධාවනය වූ වාහන පිළිබඳ තොරතුරු පහත තීර ප්‍රස්තාරයේ දැක්වේ.




1. පාරේ ගමන් කළ ත්‍රිරෝද රථ ප්‍රමාණය බස් රථ ප්‍රමාණයකින් අඩකි. එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.
2. පැයක් තුළ දී මහා මාර්ගයේ ගමන් කළ මුළු වාහන ගණන කීය ද? ................

29. ආගමික වැඩ සටහනක් පෙ.ව. 10.30 ට ආරම්භ කර ප.ව. 5.10 ට අවසන් විය.

1. එය පැවැත්වූ කාලය කොපමණ ද? ..................................................................

2. එම කාර්යය අවසන් වූ වේලාව පැය 24 ඔරලෝසුවෙන් ලියන්න. ..........................

30. සමාන දිගින් යුතු කම්බි පොටවල් පහක් ඇත. එක් කම්බි පොටක දිග 250m 20cm වේ. කම්බි පොටවල් පහේ ම මුළු දිග කොපමණ ද? ......................................................

31. 1. 28 050m කිලෝමීටර හා මීටරවලින් ලියන්න. ....................................................

2. 17km 60m මීටර වලින් ලියන්න. ..................................................................

(ලකුණු 30)

✷ **අංක 32 සිට 61 තෙක් ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

32. ''උරණ නොවෙමු කිසි ලෙසේ නිතර වෙසෙනු සිත් තොසේ ''යන පැදි පෙළෙන් කියවෙන්නේ,
1. වැඩිහිටියන්ට සැලකීමේ අගයයි
2. තරහ නොවී සිටීමේ අගයයි
3. කළගුණ සැලකීමේ අගයයි

33. නව රාත්‍රී දේව පූජාව අයත් ආගමික බැතිමතුන් වන්නේ,
1. හින්දු 2. ක්‍රිස්තියානි 3. ඉස්ලාම්

34. ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් අදහස් වන්නේ,
1. ජාතික අභිමානය
2. සිංහල ජාතිය නියෝජනය
3. ජාතියේ එකමුතු බව

35. රාජ්‍ය ලංඡනයේ වී කරලින් නිරූපණය වන්නේ,
1. සෞභාග්‍ය හා පරිපූර්ණ බව
2. සදාතනික පැවැත්ම
3. ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

36. වෙළඳපොළෙන් මිලදී ගන්නා පැණි බෝතලයක් අඩු සීනි බව දැක්වීමට යොදා ඇති වර්ණය වන්නේ,
1. රතු වර්ණය 2. කොළ වර්ණය 3. කහ වර්ණය

37. පරිසරයේ ඇති ගස් අතරින් ජල උල්පත් විශාල ප්‍රමාණයක් ආරක්ෂා කරන ගසකි.
1. කුඹුක් ගස 2. මී ගස 3. කොස් ගස

38. මාර්ග ආලෝක සංඥා පුවරුවක රතු පැහැති බල්බය දැල් වී ඇති විට
1. වාහනය නවත්වන ලෙසයි
2. වාහනය ධාවනය කරන ලෙසයි
3. වාහනය ධාවනයට සූදානම් වන ලෙසයි

39. ශ්‍රී ලංකාවේ උසම කන්ද සහ උසම දිය ඇල්ල පිළිවෙළින්,
1. කිරිගල්පොත්ත සහ බඹරකන්ද
2. බඹරකන්ද සහ දියලුම
3. පිදුරුතලාගල සහ බඹරකන්ද

40. සුළඟින් , පිපිරීමෙන් සහ ජලය මගින් ව්‍යාප්ත වන බීජ වර්ග පිළිවෙළින්,
1. වරා, රබර්, පොල් 2. වරා,හොර, පොල් 3. තොටිල,පොල්,වරා

41. වගා ආරක්ෂා වීම සඳහා සිදුවන ස්වභාවික ක්‍රියාවක් වන්නේ කුමක් ද?
1. පිටි මකුණන් සඳහා සබන් වතුර යෙදීම
2. ඇටි කුකුළන් විසින් ගොළුබෙල්ලන් ආහාරයට ගැනීම
3. කොහොඹ ඇට තළා සාදාගත් දියර ඉසීම

42. වේළීමෙන් හා වැලි යට තැබීමෙන් කල් තබා ගත හැකි ආහාරයක් වන්නේ,
1. දෙහි ය 2. බිලිං ය 3. සියඹලා ය

43. ''බැද්ද වටට සුදු මොර මල් පිපිලා'' මේ කවිය අයත් ජන කවි වර්ගය වන්නේ,
1. බඹර කවි 2. පතල් කවි 3. පැල් කවි

44. ශ්‍රී ලංකාවේ ආරම්භ වූ පළමු අධිවේගී මාර්ගය කුමක් ද?
1. කටුනායක අධිවේගී මාර්ගය
2. දක්ෂිණ අධිවේගී මාර්ගය
3. කොළඹ - නුවර අධිවේගී මාර්ගය


45. වායව පරිසරයේ වෙසෙන සතුන් ඇතුළත් පිළිතුර තෝරන්න.
1. මී මැස්සා , සමනලයා, කුරුල්ලා
2. මැස්සා, මැක්කා, ලේනා
3. කුරුල්ලා, මාළුවා,අලියා


46. පොදු ප්‍රවාහනවල ගමන් කිරීමේ දී දැකිය නොහැකි පුවරුවකි,
1. ගැබිනි මාතාවන් සඳහා වෙන් කර ඇත.
2. ආබාධිතයන් සඳහා වෙන් කර ඇත
3. කුඩා දරුවන් සඳහා වෙන් කර ඇත


47. දිරා යන කොළ රොඩු, ශාක කොටස් , ගොම වැනි දේ යොදා ගෙන සකස් කර ගන්නා පොහොර හඳුන්වන්නේ
1. කාබනික පොහොර
2. රසායනික පොහොර
3. යූරියා පොහොර

48. 
විශාල ජලාශවල වේල්ලෙහි පාමුල පළල වැඩි වීමට හේතුව වන්නේ,
1. වේල්ලේ පහළට පීඩනය අඩු නිසා ය
2. වේල්ලේ පහළට ජල පීඩනය වැඩි නිසා ය
3. වේල්ලේ අලංකාරය සඳහා ය

49. ආලෝකය වැඩි කුමන ඇටවුමේ ද?


**A**


**B**


**C**

1. **A** 2. **B** 3. **C**

50. සිතියමක මාර්ග හඳුන්වාදීමේ දී දම්පාට , රතු පාට, කළු පාට වර්ණ භාවිතා කරන්නේ පිළිවෙළින්
1. දුම්රිය මාර්ග, මහා මාර්ග, අධිවේගී මාර්ග
2. අධිවේගී මාර්ග, මහා මාර්ග, දුම්රිය මාර්ග
3. අධිවේගී මාර්ග, දුම්රිය මාර්ග, මහා මාර්ග

51. ''නවදැලි හේන'' ලෙස හඳුන්වන්නේ,
1. ගිනිතබා ආරම්භ කරන හේන
2. අලුතින් ම ගිනිතබා ආරම්භ කරන හේන
3. හේනවටා වැටක් බැඳීම

52. විටමින් B බහුල ආහාර කාණ්ඩයට අයත් වේ,

1. නෙල්ලි, නිවිති, කිරි අගුණ

2. සෝයා බෝංචි,බීට්,බණ්ඩක්කා

3. කූනිස්සෝ, තම්පලා, මස්


53. මේදය පෝෂ්‍ය පදාර්ථය අවශ්‍ය ප්‍රමාණයට නොලැබුණු විට ඇතිවන තත්ත්වයකි,

1. කුසගින්න නොදැනීම

2. ශක්තිය හීන වීම

3. ශරීරයේ පිරිපුන් බව හීන වීම

54.




මෙම පරීක්ෂණයෙන් අපට නිරීක්ෂණය කළ හැක්කේ,

1. උතුරු දිහාව හඳුනා ගැනීම

2. ජලයේ පාවෙන ද්‍රව්‍ය හඳුනා ගැනීම

3. දණ්ඩ චුම්බකය පාවෙන බව

55. බෝග වගාවට හිතකර සහ අහිතකර සතෙක් පිළිවෙළින්,

1. කටුස්සා සහ බඹරා 2. බකමූණා සහ කටුස්සා 3. පිටිමකුණා සහ දළඹුවා

56. ඖෂධයක් ලබා ගැනීමේ දී සැලකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,

1. ඖෂධ ලබා ගත යුතු වාර ගණන

2. ඖෂධ ලබා ගන්නා වෙළඳසැල

3. අනිවාර්යෙන් ම වෛද්‍යවරයෙකුගේ නිර්දේශය ලබා ගැනීම

57. ග්‍රාම නිලධාරි කාර්යාලයේ සේවාලාභීහු යනු කවු ද?

1. ග්‍රාම නිළධාරි මහතා 2. ප්‍රාදේශිය ලේකම් 3. ගම් වැසියන්

58. ඌව වෙල්ලස්ස කැරැල්ල මර්දනය කිරීම පිණිස ඉංග්‍රීසින් විසින් යවන ලද්දේ,

1. කැප්පෙටිපොල දිසාවේ 2. ගොංගාලේගොඩ බණ්ඩා 3. වීර පුරන් අප්පු

59. සීඝ්‍රයෙන් පැතිරී යන කොරෝනා රෝගය පාලනය කිරීමේදී කළ යුතු දෙයක් නොවන්නේ,

1. දුරස්ථභාවය පවත්වා නොගැනීම

2. මුහුණු ආවරණ පැලඳීම

3. සබන් ගා හොඳින් අත් සේදීම

60. වැඩ පහසු කර දෙන උපකරණ පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,

1. ආනතතලය, හැන්ද, විල්බැරෝව

2. ආනතතලය, දැතිරෝද, කප්පි

3. කප්පි, මේසය , පිහිය

61. ක්ෂණික ආහාර අනුභව කිරීමෙන් ඇතිවිය හැකි රෝගී තත්ත්වය වන්නේ,

1. දියවැඩියාව, අධික රුධිර පීඩනය

2. සරම්ප, සෙංගමාලය

3. උණසන්නිපාතය , දියවැඩියාව